# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2396/03 - 2024 අගෝස්තු මස 05 වැනි සඳුදා - 2024.08.05**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය*: BER/4/5/3/8.
*ඉඩම් අමාත්‍යාංශයේ අංකය*: 03J/91/LRB/270.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම / පරවශතාව ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ / පරවශතාවේ විස්තර:*

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 749 - කංකානම්ගොඩ ග්‍රාම නිලධාරී වසමේ, කංකානම්ගොඩ ගමේ, මාගල්ලේවෙල ඉඩමේ පිහිටි කැඩස්තර සිතියම් අංක 530746 හා 2024.02.07 දිනැති පිඹුරේ කැබලි අංක 01, 02 සහ 03 ලෙස පෙන්නුම් කරන මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර 0.0752 ක් වූ පහත විස්තර කෙරෙන ඉඩම් කැබැල්ල.

01. **කැබලි අංක 01 - ඉඩමේ නම: මාගල්ලේවෙල; විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක් සහ වැසිකිළිවලවල් දෙකක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් පාන්නා: සුහද සේවා හවුල; ප්‍රමාණය: පර්චස් 27.9**

*උතුරට*: මහබදූගේ නිමල්ශාන්ත ප්‍රනාන්දු හිමිකම් කියන ඉඩම සහ දුම්රිය මාර්ගය; *නැගෙනහිරට*: දුම්රිය මාර්ගය සහ දොන් දමිත් එදිරිසිංහ හිමිකම් කියන ඉඩම; *දකුණට*: දොන් දමිත් එදිරිසිංහ හිමිකම් කියන ඉඩම, මෙම පිඹුරේ කැබලි අංක 3 සහ 2; *බටහිරට*: කැබලි අංක 2 සහ ගාලු පාර.

02. **කැබලි අංක 02 - ඉඩමේ නම: මාගල්ලේවෙල; විස්තරය: බස් නැවතුම්පොළ; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් පාන්නා: සොයාගත නොහැක; ප්‍රමාණය: පර්චස් 0.2**

*උතුරට*: ගාලු පාර සහ මෙම පිඹුරේ කැබලි අංක 1; *නැගෙනහිරට*: කැබලි අංක 1 සහ 2; *දකුණට*: කැබලි අංක 2 සහ ගාලු පාර; *බටහිරට*: ගාලු පාර.

03. **කැබලි අංක 03 - ඉඩමේ නම: මාගල්ලේවෙල; විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක්, තාවකාලික ගොඩනැගිල්ලක් සහ වැසිකිළියක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් පාන්නා: සොයාගත නොහැක. අබ්දුල් කපූර් අබ්දුල් මුනාෂ් අනවසරයෙන් පදිංචිව සිටියි; ප්‍රමාණය: පර්චස් 1.7**

*උතුරට*: කැබලි අංක 2 සහ 1; *නැගෙනහිරට*: කැබලි අංක 1 සහ දොන් දමිත් එදිරිසිංහ හිමිකම් කියන ඉඩම; *දකුණට*: දොන් දමිත් එදිරිසිංහ හිමිකම් කියන ඉඩම සහ ගාලු පාර; *බටහිරට*: ගාලු පාර සහ පිඹුරේ කැබලි අංක 3.

ඉහත සඳහන් ඉඩම්වලට / පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ **2024 අගෝස්තු මස 28 වැනි දින පූ.භා.10.00** ට බේරුවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, **2024 අගෝස්තු 21** වැනි දිනට මත්තෙන් ඒ ඉඩම / ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම / පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

**එල්. යූ. ජානක පෙරේරා,**
ප්‍රාදේශීය ලේකම්,
බේරුවල.

2024 ජූලි මස 31 වැනි දින,
බේරුවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 08 - 0036

## ශුද්ධි පත්‍රිකාව

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වන පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය*: DS/IMA/LAN/05/03/01.
*ඉඩම් අමාත්‍යාංශයේ අංකය*: 4/3/10/2012/UDA/368.

ඉමදූව නගර සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත්කර ගැනීම වෙනුවෙන් 2014.12.15 දිනැති අංක 1893/4 දරන *අති විශෙෂ ගැසට්* පත්‍රයෙ හි 07 වන වගන්තිය යටතේ විස්තර දැක්වෙන දැන්වීමෙහි සඳහන් ඉඩම් සම්බන්ධ විස්තර පහත පරිදි සංශෝධනය විය යුතුය.

මු.පි.ගා. 4089 හි කැබලි අංක 61 ට අනුව නිවැරදි බිම් ප්‍රමාණය හෙක්ටයාර් 0.0034 ක් වන නමුත් 2024.12.15 දිනැති අංක 1893/4 දරන 7 වගන්තිය *ගැසට්* පත්‍රයේ බිම් ප්‍රමාණය හෙක්ටයාර් 0.0031 ක් ලෙස සඳහන් කර ඇත. එම බිම් ප්‍රමාණය හෙක්ටයාර් 0.0034 ලෙස නිවැරදි විය යුතුය.

**එස්. ඒ. එම්. නස්ලි,**
ප්‍රාදේශීය ලේකම්,
ඉමදූව.

2024 ජූලි මස 29 වැනි දින,
ඉමදූව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 08 - 0037